# පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය
## බස්නාහිර පළාත
## மாகாணசுகாதாரசேவைகள்பணிப்பாளர் அலுவலகம்
## மேல் மாகாணம்
## OFFICE OF THE PROVINCIAL DIRECTOR OF HEALTH SERVICES
## WESTERN PROVINCE

| මගේ අංකය<br>எனது இல<br>My No. | WP/PD/ES/5/වාර්ෂික ස්ථානමාරු | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023.09.20 |
|---|---|---|---|---|---|

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
කොළඹ/කළුතර/ගම්පහ.

<u>වාර්ෂික ස්ථාන මාරු 2024- ඖෂධ සංයෝජක</u>

උක්ත මැයෙන් ඔබ ඇමතූ මාගේ සමාංක දරණ 2023.08.07 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. ඒ අනුව, ඖෂධ සංයෝජක නිලධාරි ස්ථානමාරු ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ඖෂධ සංයෝජක නිලධාරි සංගමයේ ඉල්ලීම මත 2023.08.22 වන දින එම නිලධාරි සංගමය සමග සාකච්ඡාවක් පැවති අතර, එම සාකච්ඡාවේදී ඉදිරිපත්වූ යෝජනා හා අදහස් අනුව, ඖෂධ සංයෝජක නිලධාරි ස්ථානමාරු ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමට තීරණය කරන ලදි. සංශෝධිත ස්ථානමාරු ප්‍රතිපත්තිය මේ වන විට සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් (බ.ප.) ගේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. එම සංශෝධනය කරන ලද ඖෂධ සංයෝජක නිලධාරි ස්ථානමාරු ප්‍රතිපත්තිය මේ සමග යොමු කරන අතර, අයදුම්පත් යොමු කලයුතු අවසාන දිනය 2023.09.26 දින දක්වා දීර්ඝ කරනු ලබන බවත්, එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන ලෙසත් දන්වා සිටිමි. ඔබ වෙත ලැබෙන අයදුම්පත් හා සකස් කරන ලද උපලේඛණ **2023.10.02** වන දින **ප.ව.2.00** ට පෙර මා වෙත ලැබීමට සලස්වන ලෙසද දන්වා සිටිමි.

03. අයදුම්පත් ඉදිරිපත් කර ඇති ඖෂධ සංයෝජක නිලධාරීන්ගේ අයදුම්පත් සමග ඔවුන්ගේ වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය අනුව අනුපිලිවෙලින් සකස් කරන ලද උප ලේඛනය සහ අයදුම්පත් ඉදිරිපත් නොකල වර්තමාන සේවා ස්ථානයේ වර්ෂ 05 ට වැඩි සේවා කාලයක් සපුරා ඇති ඖෂධ සංයෝජක නිලධාරීන්ගේ නම් ඇතුලත් උපලේඛනය සේවා කාලය අනුව අනුපිළිවෙලින් සකස් කර යොමු කරන ලෙසද දන්වා සිටිමි.

03. එසේම වර්තමාන සේවා ස්ථානයේ වසර 5 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියළුම ඖෂධ සංයෝජක නිලධාරීන්ගේ තොරතුරු එවා ඇති බවටත්, එම තොරතුරු නිවැරදි බවටත් අදාල අදාල විෂය භාර නිලධාරීන් සහ පරිපාලන නිලධාරි සහ ආයතන ප්‍රධානි වගකිව යුතු බවත් දන්වා සිටිමි.

04. තවද ඖෂධ සංයෝජක නිලධාරීන් සඳහා 2024 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය 2023.10.04 වන දින පෙ.ව.9.30 ට මෙම කාර්යාලයේ දී පැවැත්වීමට තීරණය කර ඇති බවද දන්වා සිටින අතර, ඒ සඳහා ඔබ කාර්යාලයේ මාණ්ඩලික නිලධාරියෙකු නම් කර මා වෙත එවන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

වෛද්‍ය ධම්මිකා ජයලත්
බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

පිටපත් : 01. ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප.)

02. ලේකම්, රජයේ ඖෂධ සංයෝජක නිලධාරීන්ගේ සංගමය – 2023.10.04 වන දින පෙ.ව.9.30 ට පැවැත්වෙන ඖෂධ සංයෝජක නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථානමාරු මණ්ඩලය සඳහා එක් නියෝජිතයෙකු සහභාගි කිරීම සඳහා

03. තොරතුරු තාක්ෂණ අංශය – ප.සෞ.සේ.අ.කාර්යාලය (බ.ප.)



| | කාර්යාලය<br>அலுவலகம்<br>Office | පළාත් අධ්‍යක්ෂ<br>மாகாணபணிப்பாளர்Provincial Director | සැලසුම් අංශය<br>திட்டக்கூறு<br>Planning Unit | නි.අධ්‍යක්ෂ(පාලන)<br>பிரதிபணிப்பாளர் (நிர்வாகம்)<br>Deputy Director(Admin) | ප්‍රධාන ගණකාධිකාරී<br>கணக்காளர்<br>Chief Accountant | පරිපාලන නිලධාරී<br>நிர்வாக அதிகாரி<br>Adm. Officer |
|---|---|---|---|---|---|---|
| T.P | 0112434660 | 0112437154 | 0112478677 | 0112434852 | 0112437155 | 0112478868 |
| Fax | 0112478872 | 0112478872 | 0112478872 | 0112478872 | 0112478872 | 0112478872 |
| e-mail | info@healthdept.wp.gov.lk | pd@healthdept.wp.gov.lk | info@healthdept.wp.gov.lk | | | |

මාලිගාවත්ත මහ ලේකම් කාර්යාලය,තැ.පෙ.876,කොළඹ 10.மாளிகாவத்தை செயலகம்,த.பெ.இல.876,கொழும்பு 10.Maligawatta Secretariat Building, P.O. Box 876, Colombo 10.
www.healthdept.wp.gov.lk